**පරිසර අමාත්‍යාංශය**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුරේ පුරප්පාඩු පිරවීම- 2026

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුරු 11 ක් පිරවීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පහත සුදුසුකම් සපුරා ඇති නිළධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. සපුරාලිය යුතු සුදුසුකම් :**

**(I) අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම.

**(II) පළපුරුද්ද :**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ක්ෂේත්‍ර සහායක තනතුරේ වසර 10 ක ස්ථිර, සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**(III) කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු යි.

**(IV) වෙනත් :**

(අ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(ආ) පූර්වාසන්න වසර පහ තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඇ) තනතුරට පත්කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**(V)** වයස: අදාළ නොවේ.

**03. වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, මාසික වැටුප් පරිමාණය : රු. 40,000/- 10x450- 10x490- 10x540- 12x590- 61,880/= (PL 1 – 2025) වේ.

**04. සේවයේ නියුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :**

(අ) ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුරට පත්වන නිලධාරීන්ගේ තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)

(ආ) එක් වර්ෂයක වැඩ බැලීමේ කාලයකට යටත් විය යුතු ය.

(ඇ) තනතුරට පත්කිරීමෙන් පසු වසර තුනක් (03)ක් ඇතුළත පළමුවන කාර්යක්ෂතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(ඈ) තෝරා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

**05. තනතුරු සඳහා තෝරාගනු ලබන ක්‍රමය :-**

මෙම තනතුර සඳහා අයදුම්කරන නිළධාරින් අතුරින් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහායක තනතුරේ ස්ථිර, සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරීන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සඳහා නිළධාරීන් පත් කරනු ලැබේ. ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුර සඳහා පත්වීමට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අවම වශයෙන් ලකුණු 55 ක් ලබා ගත යුතු ය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ :

| අනු. අංකය | පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | සේවා පළපුරුද්ද | 40 | 55 |
| 02 | පළපුරුද්ද<br>වෙරළ සංරක්ෂණ වැඩබිම්වල ඇති පළපුරුද්ද (ගල්වැටි දැමීම හා නඩත්තුව වාචික පරීක්ෂණයක් අනුව ලකුණු ලබාදීම) | 15 | |
| 03 | යන්ත්‍ර උපකරණ හා බර වාහන පිළිබඳ ඇති දැනුම | 10 | |
| 04 | යන්ත්‍ර උපකරණ නඩත්තුව හා ක්‍රියාකරවීම පිළිබඳ දැනුම | 10 | |
| 05 | වෙරළ සංරක්ෂණ කටයුතුවලදී වගකීම් දරා තිබීම සඳහා | 20 | |
| 06 | පෞරුෂත්වය | 05 | |
| | එකතුව | 100 | |

**06. අයදුම් කිරීමේ ක්‍රමය :**

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2026.10.05** දිනට හෝ ඊට පෙර අධ්‍යක්‍ෂ ජනරාල්, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 556, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු යි. කවරයේ වම්පස උඩ කෙලවරේ "වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුර පිරවීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු යි. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

**07. සුදුසුකම් පිළිබඳ ලියවිලි :-**

(අ) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(ආ) සම්මුඛ පරීක්ෂණයේ දී පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ :

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(iii) ජාතික හැඳුනුම්පත හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,
(iv) ක්ෂේත්‍ර සහායක තනතුරට පත් කරන ලද ලිපිය,
(v) ක්ෂේත්‍ර සහායක තනතුරේ ස්ථිර කරන ලද ලිපිය,
(vi) වෙනත් අදාළ සහතික.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම.**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව පත් කිරීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**09.** මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදනය අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

**මහාචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්‍ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

2026 සැප්තැම්බර් මස 04 වැනි දින,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.
තැ.පෙ. 556,
නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,කොළඹ 10.